එහි වැසියන් තමන්ටම අපරාධ කර ගත් ස්ථාන වෙත නුඹලා නො පිවිසෙනු. නමුත් හඬා වැළපෙන්නන් ලෙස මිස

අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කරන ලදී: "අපි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සමග හිජ්ර් දේශය හරහා ඇවිඳ
ගියෙමු. එවිට අල්ලාහ්ගේ දූතයාණෝ අප හට මෙසේ පැවසූහ": "එහි වැසියන් තමන්ටම අපරාධ
කර ගත් ස්ථාන වෙත නුඹලා නො පිවිසෙනු. නමුත් හඬා වැළපෙන්නන් ලෙස මිස. ඔවුනට අත් වූ දෑ මෙන් යමක් ඔබට ද අත්වීම ගැන පරිස්සම් වන්න." පසුව අනතුරු අඟවමින් එය පසුකර යන තෙක් ඉක්මණින් ගමන් ගත්හ."
[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමූද් වාසස්ථාන අතරින් ගමන් ගත් කල්හි අපරාධ සිදු කර, තමන්ටම අපරාධ සිදු කර ගත් ඒ හේතුවෙන් දඬුවමට ලක් වූ අයගේ වාසස්ථාන වෙත පිවිසීමෙන් වැළැක්වූහ. නමුත් ඔවුන් ගැන පාඩම් ලබා, හඬා වැළපෙන්නෙකු ලෙස පිවිසෙනවානම් මිස. එය ඔවුනට අත් වූ දඬුවම තමන්ට ද අත්විය හැකැයි යන බියෙනි. පසුව එතුමාණන් නැග ආ සත්වයාට මෙල්ල කර එය පසු කර යන තෙක් වේගයෙන් ගමන් ගත්හ.

https://sunnah.global/hadeeth/si/show/66294